අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2000 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2000

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 - 08 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

01. ශ්‍රී ලංකාවේ පැරණි යුගයේ ඉතිහාසය ගොඩ නැගීමට වඩාත් ප්‍රයෝජනවත් මූලාශ්‍රය කෘතීන් අඩංගු වන්නේ පහත දක්වෙන කවර කාණ්ඩයේ ද?
(1) මහාවංස, රාජාවලිය, දාඨාවංස, කව්සිළුමිණ
(2) මහාවංස, දීපවංස, වංසත්ථප්පකාසිනී, රාජාවලිය
(3) මහාවංස, දීපවංස, අමාවතුර, රාජාවලිය
(4) මහාවංස, කව්සිළුමිණ, දීපවංස, රාජාවලිය
(5) මහාවංස, වංසත්ථප්පකාසිනී, අමාවතුර, රාජාවලිය (..........)

02. මහාවංසයට ලියන ලද ටීකාව වූයේ,
(1) වංසත්ථප්පකාසිනී
(2) කාම්බෝජ මහාවංස
(3) දීපවංස
(4) ගණ්ඨිපදත්ථවණ්ණනා
(5) සීහල අට්ඨකථා (..........)

03. වට්ටගාමිණී අභය රජුට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා දක්වෙන්නේ පහත සඳහන් කවර ලැයිස්තුවේ ද?
(1) කාලිංග මාඝ ගේ ආක්‍රමණය, මහා සාගතය, තීය බ්‍රාහ්මණයා ගේ කැරැල්ල
(2) දෙමළ අධිපතීන් ගේ ආක්‍රමණය, මහා සාගතය, තීය බ්‍රාහ්මණයා ගේ කැරැල්ල
(3) කාලිංග මාඝ ගේ ආක්‍රමණය, මහා සාගතය, මෝරිය ලම්භකර්ණ ගැටුම
(4) දෙමළ අධිපතීන් ගේ ආක්‍රමණය, කාලිංග මාඝ ගේ ආක්‍රමණය, මහා සාගතය
(5) දෙමළ අධිපතීන් ගේ ආක්‍රමණය, තීය බ්‍රාහ්මණයා ගේ කැරැල්ල, කාලිංග මාඝ ගේ ආක්‍රමණය (..........)

04. පොළොන්නරුව පාලකයන් ගේ අනුපිළිවෙළ නිවැරදිව දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද?
(1) I විජයබාහු, I වික්‍රමබාහු, I පරාක්‍රමබාහු, II ගජබාහු
(2) I විජයබාහු, නිශ්ශංකමල්ල, I වික්‍රමබාහු, I පරාක්‍රමබාහු
(3) I විජයබාහු, I ජයබාහු, I වික්‍රමබාහු, II ගජබාහු
(4) I විජයබාහු, I පරාක්‍රමබාහු, I ජයබාහු, II ගජබාහු
(5) I විජයබාහු, නිශ්ශංකමල්ල, I ජයබාහු, I පරාක්‍රමබාහු (..........)

05. රාජ්‍ය පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීමේ නිවැරදි අනුපිළිවෙළ දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද?
(1) දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
(2) දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, යාපහුව, කෝට්ටේ
(3) දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ
(4) දඹදෙණිය, ගම්පොළ, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ
(5) දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ (..........)

06. දහසය වැනි සියවසින් පසු ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට වඩාත් වැදගත් මූලාශ්‍රයන් දක්වෙන්නේ කවර කාණ්ඩයේ ද?
(1) මන්දාරම්පුර පුවත, රොබට් නොක්ස්ගේ එදා හෙළ දිව, ක්වේරොෂ් ගේ ලංකාධිපත්‍යය, රාජාවලිය, රිබේයිරෝගේ ලංකාවේ කැරැල්ල
(2) රාජාවලිය, ක්වේරොෂ්ගේ ලංකාධිපත්‍යය, පූජාවලිය, මන්දාරම්පුර පුවත, වන්නි රාජාවලිය
(3) මහාවංසය, දාඨාවංසය, පූජාවලිය, ක්වේරොෂ්ගේ ලංකාධිපත්‍යය, මන්දාරම්පුර පුවත
(4) රොබට් නොක්ස්ගේ එදා හෙළදිව, රාජාවලිය, පූජාවලිය, දාඨාවංසය, මන්දාරම්පුර පුවත
(5) රාජාවලිය, රිබේයිරෝගේ ලංකාවේ කැරැල්ල, මන්දාරම්පුර පුවත, ක්වේරොෂ්ගේ ලංකාධිපත්‍යය, දාඨාවංසය (..........)

07. උඩරට රාජ්‍යය පාලනය කළ රජවරුන්ගේ අනුපිළිවෙළ දක්වෙන්නේ කවර ලැයිස්තුවේ ද?
(1) I විමලධර්මසූරිය, සෙනරත්, II රාජසිංහ, II විමලධර්මසූරිය, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ
(2) I විමලධර්මසූරිය, II විමලධර්මසූරිය, II රාජසිංහ, සෙනරත්, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ
(3) සෙනරත්, I විමලධර්මසූරිය, II රාජසිංහ, II විමලධර්මසූරිය, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ
(4) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ, I විමලධර්මසූරිය, සෙනරත්, II රාජසිංහ, II විමලධර්මසූරිය
(5) I විමලධර්මසූරිය, සෙනරත්, II රාජසිංහ, II විමලධර්මසූරිය, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (............)

08. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නම් පහත දක්වෙන්නේ කවර ලැයිස්තුවේ ද?
(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, තෝමස් මේට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්, ජෝන් ඩොයිලි, රොබට් බ්‍රවුන්රිග්
(2) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, ජෝන් ඩේවි, තෝමස් මේට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්, රොබට් බ්‍රවුන්රිග්
(3) සී. එච්. කැමරන්, ෆ්‍රෙඩ්රික් නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග්, තෝමස් මේට්ලන්ඩ්, ජෝන් ඩොයිලි
(4) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, එඩ්වඩ් බාන්ස්, තෝමස් මේට්ලන්ඩ්, ජෝන් ඩොයිලි, ඉමර්සන් ටෙනන්ට්
(5) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, තෝමස් මේට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, එඩ්වඩ් බාන්ස්, ටොරිංටන් සාමි (............)

- අංක 09 සිට 14 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X තීරුවේ දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ ඇති නාම / ප්‍රකාශන / දින වකවානු සමඟ කිසියම් ආකාරයකින් ගැළපේ. නමුත් ඒවා නිසි අනුපිළිවෙළට දක්වා නැත. නිවැරදි පිළිවෙළට ගැළපූ විට, පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගය යටින් ඉරක් අඳින්න.

09.

| X | Y |
|---|---|
| (i) බසවක්කුලම | A. II වන අග්ගබෝධි |
| (ii) ඇළහැර ඇළ | B. පණ්ඩුකාභය |
| (iii) මහකණදරා වැව | C. I වන අග්ගබෝධි |
| (iv) කුරුඳු වැව | D. මහාසේන |
| (v) ගඟතලා වැව | E. වසභ |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA

10.

| X | Y |
|---|---|
| (i) රසවාහිනි | A. මයිල්වාක්නපුලවර් |
| (ii) පරෙවි සන්දේශය | B. වේදේහ හිමි |
| (iii) සද්ධර්මරත්නාවලිය | C. විදාගම මෛත්‍රිය හිමි |
| (iv) ලෝවැඩ සඟරාව | D. ශ්‍රී රාහුල හිමි |
| (v) යාල්පාන වෛපව මාලෛ | E. ධර්මසේන හිමි |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA

11.

| X | Y |
|---|---|
| (i) ථූපාරාම දාගැබ | A. මිහින්තලේ |
| (ii) කණ්ඨක චේතිය | B. අනුරාධපුර |
| (iii) සත්මහල් ප්‍රාසාදය | C. ගම්පොළ |
| (iv) නියම්ගම්පාය | D. පොළොන්නරුව |
| (v) සුනේත්‍රා දේවි පිරිවෙන | E. පැපිලියාන |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA

12.

| X | Y |
|---|---|
| (i) බුද්ධඝෝෂ හිමි | A. මහාසේන රජු |
| (ii) ෆාහියන් හිමි | B. මහානාම රජු |
| (iii) හේමමාලා කුමරිය | C. දේවානම්පිය තිස්ස රජු |
| (iv) සංඝමිත්තා භික්ෂුව | D. සිරිමේඝවණ්ණ රජු |
| (v) මහා මහින්ද ථෙර | E. මහානාම රජු |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA

13.

| X | Y |
|---|---|
| (i) බැරන් ෆන් ඉම්හොෆ් | A. ලන්දේසි පූජකවරයෙකි |
| (ii) පිලිප්පුස් බැල්දේස් | B. ලන්දේසි ආණ්ඩුකාරවරයෙකි |
| (iii) දියෝගු ද මේලෝ කස්ත්‍රෝ | C. බ්‍රිතාන්‍ය ජාතික දූතයෙකි |
| (iv) පෝල් පියිබස් | D. පෘතුගීසි ආණ්ඩුකාරවරයෙකි |
| (v) ගොන්සාල්වේස් | E. කතෝලික පූජකවරයෙකි |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA



Past Papers Wiki

| | X | | Y |
|---|---|---|---|
| 14. (i) | 1815 | A. | ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| (ii) | 1848 | B. | උඩරට ගිවිසුම |
| (iii) | 1873 | C. | සිංහල-මුස්ලිම් කෝලාහලය |
| (iv) | 1915 | D. | පානදූරාවාදය |
| (v) | 1931 | E. | උඩරට කැරැල්ල |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA

● අංක 15 - 19 තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති A, B, C සහ D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. **නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා**

A සහ B පමණක් නිවැරදි නම් 1 ද
B සහ C පමණක් නිවැරදි නම් 2 ද
C සහ D පමණක් නිවැරදි නම් 3 ද
A සහ C පමණක් නිවැරදි නම් 4 ද

ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් **5 ද වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

15. ශ්‍රී ලංකාවේ භූගෝලීය පසුබිම හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද?
    A. ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය වරාය වනාහි ලෝකයේ විශාලතම වූත්, සුරක්ෂිත වූත් ස්වාභාවික වරායවලින් එකකි.
    B. දිවයින දොඩම් ගෙඩියක හැඩය ගනී.
    C. ශ්‍රී ලංකාවේ දකුණු මැද කලාපය කඳු ගොඩකින් සමන්විත වේ.
    D. පහතරට තෙත් ප්‍රදේශය පැරණි ශ්‍රී ලංකාවේ ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් ප්‍රදේශයකි. (............)

16. දුටුගැමුණු රජු ගේ පාලන සමය අවසානය තෙක් රෝහණයේ ඉතිහාසය හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
    A. මහානාග සිය ආධිපත්‍යය මහාගාමයේ පිහිටුවා ගත්තේය.
    B. ගෝඨාභය රජු ගේ පාලන සමයේ දී රෝහණයේ ක්ෂත්‍රිය පවුල් දෙක අතර ගැටුමක් විය.
    C. ගෝඨාභය රජු සාමයෙන් රුහුණ එක්සත් කළේය.
    D. දුටුගැමුණු සුළුගුණාපිටියේ දී සද්ධාතිස්ස පැරදවීය. (............)

17. පැරණි ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද?
    A. ශ්‍රී ලංකාව හා ලෝකයේ වෙනත් රටවල් අතර වෙළෙඳ මාර්ග නො තිබිණි.
    B. අනුරාධපුරයේ දොරටු සතර අසල වෙළෙඳ මධ්‍යස්ථාන (නියම) තිබිණි.
    C. එල්ඩිං (පුරාණ) කාසි ලක්දිව තිබුණු ඉතා පැරණි දේශීය කාසි වර්ගය ලෙස සැලකේ.
    D. පැරණි බ්‍රාහ්මී ලිපිවල වෙළෙඳුන් ගේ ශ්‍රේණි ගැන සඳහන් නොවේ. (............)

18. 1848 කැරැල්ල සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද?
    A. කැරැල්ලේ නායකයා වූයේ කැප්පෙටිපොළ ය.
    B. කැරැල්ලට ආසන්න ම හේතුව වූයේ රජයේ නව ආදායම් බදු ප්‍රතිපත්තියයි.
    C. හෝර්ටන් ආණ්ඩුකාරයාගේ කාලයේ දී කැරැල්ල ඇති විය.
    D. මෙම කැරැල්ල මුහුදුබඩ ප්‍රදේශයට සීමා විය. (............)

19. 1766 ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
    A. මෙම ගිවිසුම දෙවන රාජසිංහ සහ ලන්දේසීන් අතර ඇති වූවකි.
    B. පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශයෙන් පලවා හැරීමට ලන්දේසීහු පොරොන්දු වූහ.
    C. උඩරට රජු මුහුදුබඩ ප්‍රදේශයෙන් බිම් තීරුවක් ලන්දේසීන්ට බාර දීමට පොරොන්දු විය.
    D. තමන් යටතේ තිබෙන ප්‍රදේශවල තම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම ලන්දේසීන්ගේ උත්සාහය විය. (............)

● අංක 20 - 26 තෙක් වූ ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් **එක්** නමක් අනෙක් නම් සමඟ **නොගැළපේ. එම නොගැළපෙන** නම කුමක්ද'යි හඳුනා ගෙන ඒට **අදාළ අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

20. (1) මහාතිත්ථ (2) සුප්පාරක (3) ගෝකණ්ණ (4) උරුවෙල (5) ජම්බුකෝල (............)

21. (1) තෝණිගල ගිරි ලිපිය (2) අඹගමුව ලිපිය (3) දෙවනගල ගිරි ලිපිය
    (4) සංගමු විහාර ගිරි ලිපිය (5) ගල් විහාර ගිරි ලිපිය (............)

Past Papers Wiki

22. (1) බුද්දදාස (2) අභය (3) සලමෙවන්
(4) පරාක්‍රමබාහු (5) සිරිසඟබෝ (............)

23. (1) ධෘතරාෂ්ට්‍ර (2) විරූඪ (3) විරූපාක්ෂ
(4) වෛශ්‍රවණ (5) ඊශ්වර (............)

24. (1) කෝරළ (2) අතුකෝරළ (3) දිසාවනිය
(4) පත්තු (5) හේවාගම් (............)

25. (1) සරසවි සඳැස (2) ලක්මිණි පහන (3) බුදුගුණාලංකාරය
(4) දිනමිණ (5) ඥානාර්ථප්‍රදීපය (............)

26. (1) පියදාස සිරිසේන (2) එස්. මහින්ද හිමි (3) මුනිදාස කුමාරණතුංග
(4) එෆ්. ආර්. සේනානායක (5) ජෝන් ද සිල්වා (............)

- අංක 27 - 31 දක්වා ප්‍රශ්න සඳහා නාම යුගල **පහක්** දක්වේ. ඒ අතර එකිනෙකට නොගැළපෙන නාම යුගලයක් ඇත. **නොගැළපෙන** නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

27. (1) ලජ්ජතිස්ස - ලැමැණි තිස්
(2) කූටකණ්ණ තිස්ස - මකලන් තිස්
(3) සීවලි - රේවති
(4) සිරිමේඝවණ්ණ - කිත්සිරිමෙවන්
(5) නිශ්ශංකමල්ල - කාලිංග විජයබාහු (............)

28. (1) විහාරමහා දේවී - දුටුගාමිණී
(2) තිලෝක සුන්දරී - පළමුවන විජයබාහු
(3) රත්නාවලී - පළමුවන පරාක්‍රමබාහු
(4) සුමිත්‍රා දේවී - පස්වන පරාක්‍රමබාහු
(5) සුනේත්‍රා දේවී - හයවන පරාක්‍රමබාහු (............)

29. (1) වේවැල්කැටිය ලිපිය - ඇතැම් ගම් සමූහවල යුක්තිය විසඳීම
(2) මිහින්තලේ පුවරුලිපි - භික්ෂූන් සඳහා උපදෙස් හා නීති
(3) බදුල්ල (හෝපිටිගම) පුවරු ලිපිය - වෙළෙඳපොළක කළමනාකරණය
(4) ගොඩවාය ලිපිය - මහායාන ධර්ම පිටපතක්
(5) වල්ලිපුරම් රන් සන්නස - විහාරයක් පිහිටුවීම පිළිබඳ වාර්තා කිරීමක් (............)

30. (1) ආරුමුග නාවලර් - හින්දු විද්‍යාලය
(2) මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි - පරම ධම්මචේතිය පිරිවෙන
(3) අරාබි පාෂා - සහිරා විද්‍යාලය
(4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - විද්‍යෝදය පිරිවෙන
(5) රත්මලානේ ධම්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙන (............)

31. (1) කැප්පෙටිපොල - විල්බාවෙ
(2) ගොංගාලේගොඩ බණ්ඩා - පුරන්අප්පු
(3) ඇහැලේපොල - පිළිමතලාව
(4) එන්. එම්. පෙරේරා - ඒ. ඊ. ගුණසිංහ
(5) එදිරිල්ලේ රාළ - පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාර (............)

- අංක 32 - 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ.** එම කරුණ තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

32. **උපෝසථ - ඝර**
(1) උපෝසථ - ඝර ආසන ඝර නමින් ද හඳුන්වනු ලැබේ.
(2) භික්ෂූන් වහන්සේලා පොහොය කිරීම සඳහා මෙහි රැස්වූහ.
(3) භික්ෂූන් වහන්සේලා නොයෙක් සංඝ කර්ම මෙහි පැවැත්වූහ.
(4) ලෝහප්‍රාසාදය මේ වර්ගයට අයත් ගොඩනැගිල්ලක් වේ.
(5) කූටකණ්ණ තිස්ස රජු උපෝසථ කර්මය සඳහා මහා ගොඩනැගිල්ලක් ඉදි කරවිය. (............)

33. **චෝළ ආක්‍රමණ**
(1) දිවයිනේ උතුරු කොටස මුම්මුඩි - සෝළ - මණ්ඩලම් යන නමින් චෝළ පළාතක් ලෙස සංවිධානය කරන ලදී.
(2) පොළොන්නරුව ජනනාථ මංගලම් යනුවෙන් නම් කරන ලදී.
(3) අනුරාධපුරය චෝළ පාලකයන් ගේ අග නුවර විය.
(4) රෝහණය චෝළ පාලනයට එරෙහිව නිරන්තරව ක්‍රියා කළේය.
(5) පළමුවන විජයබාහු රජු 1070 දී චෝළයින් දිවයිනෙන් නෙරපා දැමීය. (............)

34. **ලංකාතිලකය සහ ගඩලාදෙණිය**

(1) මේ ස්මාරක ගම්පොළ යුගයේ දී ඉදි කරන ලදී.
(2) ලංකාතිලකය පොළොන්නරු ගෘහ නිර්මාණ ශිල්පයේ ස්වාභාවික වර්ධනයකි.
(3) ගඩලාදෙණි විහාරය දකුණු ඉන්දීය ශෛලියට ගොඩ නඟා ඇත.
(4) ශිඛරය වෙනුවට ගඩලාදෙණියේ ඇත්තේ ස්තූපයකි.
(5) ලංකාතිලකය ඉදි කරවන ලද්දේ හයවන පරාක්‍රමබාහු රජු විසිනි. (............)

35. **1521 විජයබාකොල්ලය**

(1) කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීයාම.
(2) කෝට්ටේ රාජ්‍යය තුළ මුස්ලිම් වෙළෙඳුන්ගේ බලය වර්ධන වී යාම.
(3) සීතාවක රාජ්‍යයේ ආරම්භය.
(4) කෝට්ටේ රාජධානියේ රාජ්‍ය බලය දුර්වල වී යාම.
(5) පෘතුගීසි බලය වර්ධනය වීම. (............)

- පහත දැක්වෙන අංක 36 - 40 දක්වා වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර විග්‍රහය දැයි තෝරා **ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි ය. පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36. | සූරතිස්ස රජු ගේ පාලන සමයේ දී, එළාර නමැති දකුණු ඉන්දීය කුමාරයෙක් අනුරාධපුරයේ බලය පැහැර ගත්තේ ය. | එළාර රජු අවුරුදු 22 ක් අනුරාධපුරය පාලනය කළේ ය. | (...........) |
| 37. | කාශ්‍යප රජු සොහොයුරා ගැන බියෙන්, බිඳ හෙළිය නො හැකි ගිරි දුර්ගයක් වූ සීගිරිය බලකොටුව සිය රාජධානිය කර ගත්තේ ය. | කාශ්‍යප රජු සීගිරි බලකොටුවෙහි තවත් ආරක්ෂක සංවිධාන ඇති කොට, තම වස්තුව එහි රැස් කොට තබා, මුදුනේ ශෝභන ප්‍රාසාදයක් කරවා, දෙවැනි ආලකමන්දාවක් වැනි වූ ඒ රාජධානියෙහි කුවේරයා මෙන් වාසය කළේ ය. | (...........) |
| 38. | දෙවෙනි පරාක්‍රමබාහු රජු කාලිංග මාඝ පරාජය කළේ ය. | මෙම ජයග්‍රහණයට විජයබාහු සහ ජයබාහු යන කුමාරවරු සහාය වූහ. | (...........) |
| 39. | ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දුන්නේ ය. | මෙය පැරණි රජවරුන්ගේ පිළිගත් සම්ප්‍රදායක් විය. | (...........) |
| 40. | මුහුදුබඩ ප්‍රදේශවල පැවති ලන්දේසි පාලනය කැරලිවලින් තොර විය. | ලන්දේසීහු උඩරට රාජ්‍යය සමඟ සාමකාමී සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට උත්සාහ කළෝ ය. | (...........) |

PAST PAPERS WIKI
PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2000 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2000

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න

## II කොටස

01. පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම පිළිබඳ විචාරාත්මක විස්තරයක් කරන්න.
    (i) සාහිත්‍ය සම්ප්‍රදාය
    (ii) ආර්යාවර්තයේ බටහිර සහ නැගෙනහිර පෙදෙසින් ආර්ය භාෂාව කතා කළ මිනිසුන් දෙ කොටසක් සංක්‍රමණය වීම.
    (iii) දිවයිනේ ප්‍රදේශ කිහිපයක ආර්ය ජනාවාස වර්ධනය සහ ව්‍යාප්තිය **(ලකුණු 14 යි)**

02. පහත දැක්වෙන මාතෘකාවලින් **දෙකක්** උපයෝගී කරගෙන දේවානම්පිය තිස්ස රජු ගේ පාලන සමයේ ඇති ආගමික හා සංස්කෘතික වැදගත්කම සාකච්ඡා කරන්න.
    (i) ඉන්දියාව සමඟ පැවැති සම්බන්ධතා
    (ii) ශ්‍රී ලංකාවේ බුද්ධාගම පිහිටුවීම.
    (iii) ගෘහ නිර්මාණ ශිල්පය
    (iv) රටවැසියා බුද්ධාගමට හැරවීම නිසා ඔවුන්ගේ ජීවන රටාව කෙරෙහි ඇති කළ බලපෑම් (එක කොටසකට **ලකුණු** 07 බැගිනි.)

03. පහත සඳහන් මාතෘකාවන්ගෙන් **දෙකක්** පිළිබඳ ව විචාරාත්මක සටහන් ලියන්න.
    (i) ධාතුසේන රජු ගේ පාලන සමයේ වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය.
    (ii) පොළොන්නරු යුගයේ චිත්‍ර කලාව සහ ගෘහනිර්මාණ ශිල්පය.
    (iii) දෙවන පරාක්‍රමබාහු රජු ගේ පාලන සමයේ වැදගත්කම.
    (iv) කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යයේ වර්ධනය. (එක කොටසකට **ලකුණු** 07 බැගිනි.)

04. පළමුවන විජයබාහු රජු ගේ කාර්ය සංසිද්ධීන් විචාරාත්මක ව විග්‍රහ කරන්න. **(ලකුණු 14 යි)**

05. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
    (i) අභයගිරිය (ii) අභිෂේක (iii) පත්තිනි දේවී පිදීම (iv) සඳකඩපහණ
    (v) යාපහුව (vi) කහවණු (vii) ආර්යචක්‍රවර්තීන් (viii) දමිළාධිකාරීන් **(ලකුණු 14 යි)**

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පැවති පෘතුගීසි බලය සහ පාලනය කෙරෙහි සැලකිලිමත් වෙමින් පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.
    (i) ප්‍රතිකාලුන්ට කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන බලය අත්පත් කර ගැනීමට ආධාර වූ ප්‍රධාන සාධක.
    (ii) කෝට්ටේ රාජ්‍යය තුළ පැවති පෘතුගීසි පාලනය.
    (iii) කෝට්ටේ රාජධානිය තුළ පෘතුගීසීන්ගේ මිෂනාරි කටයුතු.
    (iv) උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට පෘතුගීසීන් දැරූ උත්සාහය අසාර්ථක වීම. (එක කොටසකට **ලකුණු** 07 බැගිනි.)

07. ශ්‍රී ලංකාව තුළ ඕලන්දයන් පවත්වාගෙන ගිය පරිපාලන හා ආර්ථික ක්‍රමයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කවරේ ද? **(ලකුණු 14 යි)**

08. ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකයේ සංවර්ධනය පහත සඳහන් මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
    (i) කෝපි කර්මාන්තයේ සංවර්ධනයට හා පරිහානියට දායක වූ ප්‍රධාන සාධක.
    (ii) වැවිලි ආර්ථිකය යටතේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස්වීම්. **(ලකුණු 14 යි)**

09. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රබෝධය සහ ස්වාධීනත්වය සඳහා වූ ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් මාතෘකා **දෙකක්** පිළිබඳව සටහන් ලියන්න.
    (i) කර්නල් එච්. එස්. ඕල්කට් (ii) ලංකා ජාතික සංගමය
    (iii) වාමාංශික ව්‍යාපාර (iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ විධායක කාරක සභා ක්‍රමය
    (v) ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් (එක කොටසකට **ලකුණු** 07 බැගිනි.)


10. ඔබට සපයා ඇති සිතියමෙහි අංක 1 ආර්ය ජනාවාසයකි. අංක 2 වරායකි. අංක 3 දෙවන මොග්ගල්ලාන රජු කර වූ වැවකි. අංක 4 ගංගාවකි. අංක 5 පාලන කොට්ඨාශයකි. අංක 6 දුර්ගයකි. අංක 7 ඓතිහාසික වැදගත්කමකින් යුත් නගරයකි. අංක 8 ඓතිහාසික හා ආගමික වැදගත්කමකින් යුත් නගරයකි. **ඒ සියලුම ස්ථාන සපයා ඇති සිතියමෙහි නම් කොට ඉන් දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න. (නම් කිරීමකට ලකුණු 1 බැගිනි. කෙටි සටහනකට ලකුණු 05 බැගිනි.)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2000 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2000

ප්‍රශ්න අංකය 10

විභාග අංකය..........................................................




WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library